කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය

මානව හිමිකම් හා සාම අධ්‍යයනය පිළිබඳ
දුරස්ථ ඩිප්ලෝමා පාඨමාලාව 2005/2006

# මානව හිමිකම් (ප්‍රශ්න පත්‍රය - I)

(පැය දෙකයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

ප්‍රශ්න තුනකට (03) කට පමණක් පිළිතුරු ලියන්න

(1) පුද්ගලයන්ගේ නෛතික අයිතිවාසිකම් ලෙස මානව හිමිකම් ඒවායේ තත්වය ලබාකර ගෙන තිබෙන පරිනාමික ක්‍රියාවලිය සාකච්ඡා කරන්න.

(2) ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් අතර පවතින සම්බන්ධතාව ගැන අදහස් දක්වන්න. ප්‍රායෝගික නිදසුන් මගින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(3) මූලික අයිතිවාසිකම් හා මානව හිමිකම් අතර යම් වෙනස්කමක් පවතීද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(4) මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීමෙහිලා එක්සත් ජාතීන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න. ඒවා ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන් විසින් ඇතිකර තිබෙන යාන්ත්‍රනයන් දෙකක් විස්තර කරන්න.

(5) ඔබගේ මතය අනුව, ශ්‍රී ලංකාව, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වෙමින් මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම උදෙසා ප්‍රමාණවත් නෛතික බැඳීම් ඇති කරගෙන තිබේද? එම බැඳීම් යටතේ රජයේ ක්‍රියාකාරීත්වය සමඟ ඔබ සෑහීමකට පත්වන්නේද?

(6) පොදු අධිකාරීන් විසින් ඔහුගේ / ඇයගේ මානව හිමිකම් උල්ලංඝණයන් සිදු කළ විට යම්පුද්ගලයකුට ශ්‍රී ලංකාව තුල සහන අයද සිටිය හැකි ස්ථාන කවරේද? ඔබගේ මතය අනුව, එම ප්‍රතිකර්ම ඵලදායිද සහ එසේ නොවේනම්, ඇයි?

********

කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය

මානව හිමිකම් හා සාම අධ්‍යයනය පිළිබඳ
දුරස්ථ ඩිප්ලෝමා පාඨමාලාව 2005/2006

# සාම අධ්‍යයනය (ප්‍රශ්න පත්‍රය - II)

(පැය දෙකයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 06

ප්‍රශ්න තුනකට (03) කට පමණක් පිළිතුරු ලියන්න

1. "සාමය යනු යුද්ධය හෝ ගැටුම නැති බව පමණක් නොවේ." මෙම ප්‍රකාශය පිළිබඳව විවරණයක් ලියන්න.

2. ගැටුම කෙටියෙන් නිර්වචනය කරන්න. ගැටුම තරඟයෙන් වෙනස්වන්නේ කෙලෙස කුමක් නිසාදැයි ඔබ සිතන්නෙහිද?

3. ගැටුම්හී ප්‍රධාන හේතු දෙකක් විස්තර කරන්න.

4. ඔබේ අදහස පරිදි ගැටුමක පහසුවෙන් හඳුනාගත හැකි අදියර කවරේද?

5. සාම ක්‍රියාවලියකදී එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉටු කළ හැකි කාර්යභාරය කුමක්ද?

6. සාම සාකච්ඡාවලදී තුන්වැනි පාර්ශවයක වැදගත්කම කුමක්ද?

*********